# උතුරු පළාත් සභා ප්‍රධාන ලේකම් කාර්යාලය

**උතුරු පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ මාණ්ඩලික නිලධාරී පුරප්පාඩු සඳහා දීපව්‍යාප්ත සේවයේ සිට විශ්‍රාම ලද නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම.**

දැනට උතුරු පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ දීපව්‍යාප්ත සේවයේ සඳහා වන පහත සඳහන් පුරප්පාඩු, අංක 3/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධි විධාන වලට අනුව ඒ ඒ සේවාවන් වල සේවයේ නියුක්තව විශ්‍රාම ලද නිලධාරීන්ගෙන් අයදුම්පත් විසින් කැඳවා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයට පත් කිරීම මගින් සම්පූර්ණ කිරීමට උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත.

| තනතුර | ශ්‍රේණිය |
|---|---|
| 01. ශ්‍රී ලංකා පරිපාලන සේවය | III, II වන ශ්‍රේණිය |
| 02. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | III, II වන ශ්‍රේණිය |
| 03. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | III, II වන ශ්‍රේණිය |
| 04. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | III, II වන ශ්‍රේණිය |

තෝරා ගන්නා ලද අයදුම්කරුවන් ඉහත චක්‍ර ලේඛයේ සඳහන් විධි විධාන වලට අනුව එක් වර්ෂයකට හෝ ඔවුන්ගේ වයස අවුරුදු 67 සම්පූර්ණ වන දිනට පෙර දිනය යන දෙකෙන් මුලින්ම පැමිණෙන දිනය දක්වා පමණක් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයට පත් කරනු ලැබේ.

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේදී තමාගේ සුදුසුකම් සනාථ කරන ලිපි ලේඛන මෙන්ම මනා ශාරීර සෞඛ්‍ය තත්ත්වයක් ඇති බව සනාථ කිරීමට රජයේ වෛද්‍ය සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය.

අයදුම්කිරීමට කැමති සුදුසුකම් සහිත විශ්‍රාමිකයන් තමන්ගේ ජීව දත්ත පත්‍රිකාව හා විශ්‍රාම වැටුප් ප්‍රධාන පත්‍රයේ සහතික කරන ලද ඡායාපිටපතක් ද 2018.05.03 දින දහවල් 12.00 ට පෙර සඳහන් කරුණු ලබන ලිපිනයට ලැබිය හැකි වන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. තවද කාර්යාලය වෙත පැමිණ භාර දෙන අයදුම්පත් භාර ගනු නොලබන අතර තැපැල් මගින් සිදු වන ප්‍රමාද පිළිබඳව උතුරු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් වගකීම දරණු නොලැබේ.

ආදර්ශ අයදුම්පත www.np.gov.lk යන වෙබ් ලිපිනයෙන් ලබා ගත හැක.

ප්‍රධාන ලේකම්
ප්‍රධාන ලේකම් කාර්යාලය
උතුරු පළාත් සභා සංකීර්ණය
නුවර පාර
කයිතඩි, යාපනය.
සටහන- අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත් පදනම මත අයදුම් කිරීම ලෙස නොවරදවාම සඳහන් කරන්න.

එ.පත්තිනාදන්
ප්‍රධාන ලේකම්
උතුරු පළාත.

2018.04.19